CENTRE FOR MONITORING ELECTION VIOLENCE
මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය
தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்
No 6/5, Layards Road, Colombo 05, **Tel:** 011 3010664,011 2081384/6 Ext 123
**Fax**: 011 2081388 **E-mail**: cmev@cpalanka.org **Web**: www.cmev.org


**පුවත්පත් නිවේදනය :**

## රාජ්‍ය දේපළ අවභාවිත කළ නිලධාරීන්ට දඬුවම් ලබා දීම මෙරටේ පුරවැසියන් ලැබූ අනගිභවනීය ජයග්‍රහණයකි.

රාජ්‍ය දේපළ අවභාවිත කරමින් තම මැතිවරණ ව්‍යාපාර මෙහෙයවීම මෙරටේ ආණ්ඩු බලය හිමි දේශපාලන පක්ෂවලට ආවේණික සම්ප්‍රදායක්ව පවතී. කලින් කළ පත්වන ආණ්ඩු රාජ්‍ය සම්පත් අවභාවිත කර ඇත්තේ ඉතා නිර්ලජ්ජිත අන්දමිනි. එවන් දූෂිත ක්‍රියාමාර්ග ප්‍රශ්ණ කිරීමට හා ඒවාට නිසි දඩුවම් ලබාදීම සඳහා ඉදිරිපත් වීමට මෙරටේ කිසිදු ආණ්ඩුවක් මෙතෙක් මැදිහත් ව ක්‍රියාමාර්ග ගෙන නැත. එය වඩාත් තීව්‍ර වූ  මැතිවරණය වසර 2015 පැවති ජනාධිපතිවරණයයි. රාජ්‍ය සම්පත් අවභාවිතය මහා පරිමාණමය හා වඩාත් සංවිධානාත්මක ලෙස සිදුකරමින් පැවැත් වූ එකී මැතිවරණය ඉතිහාසයට එක් වූයේ මෙරටේ සිදුකළ සුවිශාලතම රාජ්‍ය සම්පත් අවභාවිතයක් සහිත ජනාධිපතිවරණයක් ලෙසිනි. එලෙස පැවති ජනාධිපතිවරණයට සමාන්තරව පූර්ව ජනාධිපතිවරණ කාලසමය තුළ රාජ්‍ය සම්පත් අවභාවිත කිරීමේ පුරෝගාමී කාර්යය සිදුකිරීමේදී මූලිකත්වය ගන්නා ලද්දේ ජනාධිපති ලේකම් කාර්යාලය හා එය හෙබවූ නිලධාරීන්ය. එකී නිලධාරීන් හිටපු ජනාධිපතිවරයා ඇතුළු තම ස්වාමිවරුන් ලෙස සැලකූ බලගතු ඇමතිවරුන්ගේ බසට අවනතව සිදුකළ ඉහළ පරිමාණයේ මූල්‍ය අවභාවිතාවන්ගෙන් එකක් වූයේ සිල්රෙදි බෙදාදීමයි.

සිල්රෙදි පමණක් නොව භික්ෂූන් වහන්සේලා වෙත සිවුරු පිරිකර ද රජයේ මුදල් යොදා ගනිමින් එලෙස බෙදාහරින ලදි. මෙකී සමස්ත ක්‍රියාවලිය සිදු කරන ලද්දේ ජනාධිපතිවරණ ජයග්‍රහණය අපේක්ෂා කරමිනි. හේතුව නම් එවැන්නක් මැඩපැවැත්වීම පොලිසීයට හෝ මැතිවරණ නිලධාරීන්ට එතරම් පහසු කාර්යයක් නොවීමයි. ඊට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන අවස්ථාවේදී එය ආගමික කටයුතු සඳහා මැදිහත්මක් යැයි අර්ථගැන්වීම ඊට හේතුවයි. පසුකලෙක, හිටපු ජනාධිපතිවරයා වූ මහින්ද රාජපක්ෂ මහතා එය නිර්වචනය කරන ලද්දේ "හාමුදුරුවනේ අපි සිවුරක්, සිල් රෙද්දක් බෙදා දුන්නාම මොකද" යනුවෙනි.

එලෙස ඉතා සරලව විග්‍රහ කල ද එකී දේශපාලන ව්‍යාපෘතියේ පිරිවැය මිලියන 600 කට වඩා අධික විය. එකී වැය බර දරන ලද්දේ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මඟිනි. රජයේ සම්පත් අවභාවිත කළා පමණක් නොව ඉතා නිර්ලජ්ජිත ලෙස ආගම ධර්මය ද තම මැතිවරණ ප්‍රචාරණය උදෙසා යොදාගත් එකී කුප්‍රකට මෙහෙයුමෙහි ප්‍රතිඵල අද වන විට ලැබී ඇත. එනම් ඊට වගකිව යුතු ඉහළම රාජ්‍ය නිලධාරින් හට දඬුවම් ලබාදීමට මහාධිකරණය තීරණය කිරීම මඟිනි.

පසුගිය පූර්ව ජනාධිපතිවරණ කාල පරාසය තුළ සිල් රෙදි බෙදාදීමේ කුප්‍රකට ක්‍රියාවලිය අනාවරණය කරමින් එය වළක්වාලීම සඳහා මූලිකවම ක්‍රියාකරන ලද්දේ එවකට මැතිවරණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පොලීසිය සහ මෙරටේ ක්‍රියාකාරී මැතිවරණ නිරීක්ෂණ සංවිධානයි. මැතිවරණ නිරීක්ෂණ සංවිධාන මේ පිළිබඳ තම බලවත් විරෝධය ආරම්භයේ සිට ම පළකරන ලදි. එහෙත් සමහර දේශපාලන පක්ෂ එය නිර්වචනය කරන ලද්දේ බටහිර රාජ්‍යයන් හරහා මුදල් ලබා ගනිමින් මෙරටේ බෞද්ධ සිද්ධස්ථානයකට ලැබෙන චීවරයක් පවා ලබාදීමට මෙවැනි සංවිධාන ඉඩ නොදෙන බව පවසමිනි. අවසානයේදී මෙරටේ ප්‍රගතශීලී බලවේගයන්හී අනලස් දායකත්වයෙන් සිදු කළ අරගලයක ප්‍රතිඵල ලැබී ඇත. අනාගත මැතිවරණයකදී කවරාකාරයෙන් කටයුතු කළ යුතුද යන මාර්ගෝපදේශය, මෙරටේ රාජ්‍ය සේවකයන් වෙත මෙමඟින් ලැබී ඇතැයි යන්න අපගේ විශ්වාසයයි.

මෙකී නඩු තීන්දුව මෙරටේ සමාජ සාධාරණත්වය අපේක්ෂා කරන පුරවැසියන්ගේ අමන්දානන්දනයට හේතු වනවා නොඅනුමානය. එකී කාර්යය සඳහා කැපවෙමින් මෙරටේ යුක්තිගරුක හා සාධාරණත්වය අපේක්ෂා කරන පුරවැසියන්ගේ බලාපොරොත්තු ඉටු කරන ලද මහාධිකරණ විනිසුරුවරයා ප්‍රමුඛ සියලු පාර්ශව වෙත මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයේ ප්‍රණාමය හිමිවේ.